# 2019 සැප්තැම්බර් මාසය සඳහා අයැදීමට සහ මැදිහත් වීමට අත්වැලක්

**මම ඔබට ඒකමතික සිතක් දෙන්නෙමි. අළුත් ආධ්‍යාත්මික බලයක් ද නුඹලා තුළ තබන්නෙමි. ඔබ මාගේ පණත් ප්‍රකාර හැසිර, බොහෝ නියෝග රක්ෂා කොට පවත්වන පිණිස, ඔබගේ ගල් සිත පහ කොට මුදු මොලොක් සිතක් ඔබට දෙන්නෙමි."**

( එසකියෙල් 11:20-21)

ආදි මව්පියන් හෙවත් ආදම් සහ ඒව දෙවියන් වහන්සේට අකීකරු වූ නිසා දුක, වේදනාව සහ මරණය මිනිසාට උරුම වූ බව ශුද්ධවූ බයිබලයේ පුරාණ ගිවිසුම කියවද්දී අපට මනාව වැටහේ. එදා දෙවියන් වහන්සේ තෝරා ගත් ඊශ්‍රායෙල් නමැති ජනතාව පාරාවෝගේ වහල් භාවයෙන් මුදා පොරොන්දු දේශය කරා ගෙන යන ගමනේදී දෙවියන් වහන්සේ ඉදිරියේ මැදිහත් කරුවෙකු වූ මෝසෙස් තුමන්ට ඔවුන්ව හසුරුවා ගැනීමට බොහෝ පීඩා විඳීමට සිදු විය. එම නිසාම එතුමන් බොහෝ ඉවසීමෙන් නිතර නිතර කඳු මුදුනට ගොස් යහවේ දෙවියන් වහන්සේට දෑත් දිගු කර බොහෝ යාච්ඤා කලේ, කන්නලව් කලේ මෙම ජනතාව හසුරුවා ගැනීමට උදව් වන ලෙසයි. එහෙත් ඔවුන්ගේ මුරණ්ඩු ගල් සිත් පහ කිරීමට බොහෝ අසීරු වූ විට දෙවියන් වහන්සේ ඔවුන්ට දඬුවම් පැමිණවූ අවස්ථා බොහෝ විය.

එහෙත් දෙවියන් වහන්සේ අනුකම්පාබරිත, දයානුකම්පාවෙන් යුත් දෙවියන් වහන්සේ නිසා ඔවුන්ට අසීමිත ලෙස ප්‍රේම කළ සේක.

එලෙසෙම අපි මෙම මාසය නියමිත දේව වචනය තුළ දෙවියන් වහන්සේ ම ඔවුන් වෙනුවෙන් පළමු පියවර ගනිමින් ඔවුන්ගේ ගල් සිත් මුදු මොලොක් කර අළුත් ආධ්‍යාත්මික බලයක් දීමට එසකියෙල් නමැති දිවැසිවරයාගේ මැදිහත් අයැදීම තුළ පොරොන්දු වෙයි.

එම පොරොන්දුව පසුකාලීනව දෙවියන් වහන්සේ මුළු මිනිස් සංහතියේ පාපයට වන්දි වශයෙන් අප වෙත එවූ මෙසියස් හෙවත් ජේසු ක්‍රිස්තුන් වහන්සේගේ දිවි පිදූ කුරුසියේ යාගය තුළ මෙන්ම මරණයෙන් උත්ථාන වී ඔවුන් වහන්සේ දේව ජනතාව වෙත එවූ සැනසිලි කාරයාණන් හෙවත් ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලය තුළ මනස්ස්ථාපනය වී පව්කමාව සහ ගැළවීම ලබා දීමට සැළැස්විය.

අයැදීමේ සේවකයන් වශයෙන් මෙම මාසය පුරාවටම තවමත් අප පවුල තුළ, සංඝය, මීසම, සභාව තුළ මෙන්ම අප දේශය තුළ සිටින මුරණ්ඩු ගල් සිත් ඇති අය තුළ ශුද්ධාත්මයාණන්ගේ ආලෝකයෙන් මුදු මොලොක් සිත් ඇති වෙමින්, බැගෑ සිතින් දෙවි සරණ සොයා දෙවියන් වහන්සේගේ රාජ්‍යයේ ලක්ෂණ සෑම හදවතක් තුළ ඇතිවන්න කියා අඛණ්ඩව අයැදිමු. එමෙන්ම බේද කිරීමේ ආත්මය අප තුලින්, අප පවුල, සංඝය, සභාව, රට තුලින් පහ කරන්න කියා ජේසු ක්‍රිස්තුන් වහන්සේගේ නාමයෙන් අණ කරමින් යාච්ඤා කරමු.

**"සමිඳාණෝ දයාවන්ත ය,**
**අනුකම්පාවෙන් පූර්ණ ය;**
**වහා නොකිපෙන සුළු ය**
**තිරසර පෙමින් යුතු ය."** (ගීතාවලිය 145:8)

පළමු සතිය - දිව්‍යමය කියවීම - එසකියෙල් 11:16-21

අයැදීමට විශේෂ යොමුව :

මුරණ්ඩු වූ, ගල් සිත් ඇති අය වෙනුවෙන්. (විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :

* ස්වාමි තාත්තා වෙනුවෙන්
* දිවැසි එකතුව, සහයක එකතුව, සුසමත එකතුව ඇතුළු පුබුදුව තුළ වගකීම් ගන්නා සියළු දෙනා වෙනුවෙන්.
* පුබුදුව තුළ ආත්මික අධ්‍යක්ෂක ලෙස පත් වූ රොබින්සන් විජේසිංහ පියතුමන් වෙනුවෙන්.
* සැප්තැම්බර් මස පළවන ඉරිදා ඒ ඒ සාංඝිකවල පැවැත්වෙන රට වෙනුවෙන් අයැදීමේ යැදුම තුළ ශුද්ධාත්ම බලය ක්‍රියාත්මක වන පිණිස.
* සැප්තැම්බර් 7 වන සෙනසුරාදා ප්‍රශංසාරාමයේ පැවැත්වෙන පුබුදු ජාතික මව් රැළිය වෙනුවෙන්.
* සැප්තැම්බර් මාසය තුළ ආරම්භ කෙරෙන පශ්චත්තාපයේ සහ මනස්ස්ථාපනයේ දින 40 භාවනාවට සියළුම ජනතාව ඇතුළු වන පිණිස.
* ප්‍රශංසාරාමයේ විදුලි අංශයේ කටයුතු සඳහා සුදුසු අයෙකු ලැබෙනු පිණිස.
* වෙනත් අයැදීම්....

දෙවන සතිය - දිව්‍යමය කියවීම - රෝම 5:1-5

අයැදීමට විශේෂ යොමුව :

සැප්තැම්බර් මාසය තුළ ඇරඹෙන දින 40 භාවනාව තුළින් පුබුදු ජනතාව තුළ ශුද්ධාත්මයාණන්ගෙන් අළුත් අධ්‍යාත්මික බලයක් ලැබෙන්න සලස්වන පිණිස. (විනාඩි 5ක් පමණ)

වෙනත් අයැදීම් :

* සැප්තැම්බර් මස 11,12,13,14,15වන දින දක්වා ශ්‍රී ප්‍රශංසාරාමයේ පැවැත්වෙන බයිබල් ශුද්‍ධානකාන්තියට සහභාගි වන සියළුම ජනතාව සහ වචනයේ සේවකයන් වෙනුවෙන්.
* සුබැඳි සංඝය වෙනුවෙන්.
* ත්‍රස්ත ප්‍රහාරය නිසා තවමත් තුවාල ලබා ප්‍රතිකාර ලබන අය සහ මානසික පීඩනයට ලක්වී ඇති සියළුම අය වෙනුවෙන්.
* අනාථ කඳවුරුවල, මහළු නිවාසවල, මානසික රෝහල්වල සහ විවිධ අන්දමින් අසරණ වී, කොරවී සිටින සියළු දෙනා වෙනුවෙන්.
* වෙනත් අයැදීම්....

තෙවන සතිය - දිව්‍යමය කියවීම - ජාකොබ් 1:19-26

අයැදීමට විශේෂ යොමුව :

පිලිකා සහ වකුගඩු රෝගවලින් පෙළෙන සියළු දෙනා වෙනුවෙන් සහ මෙම රෝගයන් මුළු ලෝකයෙන්ම තුරන් වන පිණිස. (විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :

* ක්‍රිස්තු දානයේ වැඩ පිළිවෙලවල් ලෙස පුබුදුව තුළ දියත් කෙරෙන ජුසේ වාස් සුදුවරයාගේ ජීවිත චරිතය අලලා මුල් කරගෙන සකස් වී ඇති නාට්‍ය කණ්ඩායම සහ එය සංවිධානය කරන සියළු දෙනා වෙනුවෙන්.
* සැප්තැම්බර් 21 වනදා ප්‍රශංසාරාමයේ පැවැත්වෙන කලා ප්‍රසංගය තුළ ශුද්ධාත්මයාණෝ ක්‍රියා කරන පිණිස.
* වෙනත් අයැදීම් .....

සතරවන සතිය - දිව්‍යමය කියවීම - ගීතාවලියේ 91 ගීතිකාව මාරුවෙන් මාරුවට පදෙන් පදේ කියවන්න.

අයැදීමට විශේෂ යොමුව :

දේශය වෙනුවෙන් (විනාඩි 20ක් පමණ)

වෙනත් අයැදීම් ........

- අයැදීමේ සහ මැදිහත් වීමේ සේවාව -

*****************************